# බුද්ධ සංකල්පයේ පරිණාමය සහ අටවිසි බුද්ධ වන්දනය පිළිබඳ විමර්ශනයක්

**තබ්බෝවේ කාරුණික හිමි**[1]

## හැඳින්වීම

බුදුසමය යනු ලෝකයේ පැරණිත ම මෙන් ම පුළුල්ව ම ව්‍යාප්ත වූ ආගමික හා දාර්ශනික සම්ප්‍රදායයන්ගෙන් එකකි. එහි සමස්ත අවධානය කේන්ද්‍රගත වී ඇත්තේ 'බුද්ධ' යන උත්තරීතර සංකල්පය වටාය. සාමාන්‍ය භාෂාමය සීමාවන්ට යටත් කළ නොහැකි, පරම අවබෝධය ලෙස හැඳින්වෙන 'බුද්ධත්වය' සම්බන්ධ අර්ථකථන ත්‍රිපිටකයේත්, අටුවා-ටීකා සාහිත්‍යයේත් විවිධාකාරයෙන් විස්තර කර තිබේ. එම විස්තර ඔස්සේ ගොඩනැගුණු බුද්ධ සංකල්පය, අතීතයේ වැඩසිටි සත් බුදුවරුන්ගේ සිට අටවිසි බුදුවරුන් දක්වා ක්‍රමිකව විකාශය වී ඇත. අද දක්වා ම බෞද්ධ සමාජය තුළ ජනප්‍රියව පවතින විවිධ භක්ති චාරිත්‍ර බිහි වීමට පසුබිම සැකසෙන්නේ මෙම සංකල්පීය වර්ධනය හරහා ය.

ත්‍රිපිටකයට අනුව 'බුද්ධ' යනු හුදෙක් එක් පුද්ගලයෙකුගේ නාමයක් නොව, ලෝකයේ යථා ස්වභාවය පූර්ණ ලෙස අවබෝධ කරගත් ඕනෑම උත්තමයෙකුට හිමි වන පොදු නාමයකි. එබැවින් අතීතයේ බුද්ධත්වය සාක්ෂාත් කරගත් අනන්ත සංඛ්‍යාවක් බුදුවරුන් වැඩසිටි බවට වූ අදහස පුරාණ බෞද්ධ සාහිත්‍යය තුළ ක්‍රමිකව ගොඩනැගී තිබේ. සාමාන්‍ය මානව මනෝභාවයන් ඉක්මවා යන දීර්ඝකාලීන පාරමී පූරණයක් ඒ සඳහා අවශ්‍ය වන බැවින්, බුද්ධත්වය නමැති තත්ත්වය සංඛ්‍යාත්මකව නිශ්චිතව ගණනය කළ නොහැකි 'අචින්ත්‍ය විෂයයක්' ලෙස හඳුනා ගැනේ. මෙම සුවිශේෂී ලක්ෂණය නිසා ම, කාලයාගේ ඇවෑමෙන් සත් (7), සූවිසි (24) සහ අටවිසි (28) වශයෙන් බුදුවරුන් පිළිබඳ විස්තර වර්ධනය වී, අනන්ත සසරෙහි විශ්වය පුරා පහළ වූ බුදුවරුන් පිළිබඳ අදහස බෞද්ධ සමාජය තුළ තහවුරු විය.

මෙම පර්යේෂණ පත්‍රිකාව හරහා බුද්ධ යන පදයේ වාච්‍යාර්ථය, එහි සංකල්පීය සංවර්ධනය සහ ඒ මත පදනම්ව ගොඩනැගුණු අටවිසි බුද්ධ වන්දනය පිළිබඳ ගැඹුරු විමර්ශනයක් ඉදිරිපත් කෙරේ. බුද්ධ සංකල්පය මෙලෙස පුළුල් පරාසයක් දක්වා විහිදී ගිය ආකාරය හඳුනාගැනීම, සමකාලීන බෞද්ධ පූජා චාරිත්‍රවල මූලික පදනම අවබෝධ කර ගැනීමට මහත් සේ උපකාරී වනු ඇත.

## පර්යේෂණ ගැටලුව සහ අරමුණු

මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වන්නේ මූලික බුද්ධ සංකල්පය අටවිසි බුද්ධ වන්දනාව දක්වා ක්‍රමිකව කෙසේ වර්ධනය වූයේ ද යන්න අධ්‍යයනය කිරීමයි. ඒ යටතේ පහත සඳහන් ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කෙරේ:

1 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. karunikathero@gmail.com

- ත්‍රිපිටක සහ අටුවා ග්‍රන්ථවල දැක්වෙන ආකාරයට 'බුද්ධ' යන පදයේ වාච්‍යාර්ථය හඳුනාගැනීම
- බුද්ධ සංකල්පය කාලයත් සමග ක්‍රමිකව සංවර්ධනය වූ ආකාරය විශ්ලේෂණය කිරීම
- අටවිසි බුද්ධ වන්දනාව සහ ඒ ආශ්‍රිත සෙසු පූජා චාරිත්‍ර හඳුනාගැනීම

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී ග්‍රන්ථ සංධාර ක්‍රමවේදය භාවිත කෙරේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය, සඟරා හා කෝෂ ග්‍රන්ථ පරිශීලනය තුළින් දත්ත රැස්කිරීම සිදු කොට ඇත.

**ප්‍රතිඵල**

'බුද්ධ' යන පදය පාලි භාෂාවේ එන 'බුධ්' (දැනගැනීම/ අවබෝධ කරගැනීම) යන ධාතුවෙන් නිපදවී ඇත. බුද්ධත්වය යනු සාමාන්‍ය භාෂාමය ප්‍රකාශනවලින් සම්පූර්ණයෙන් විස්තර කළ නොහැකි, පරම අවබෝධාත්මක අත්දැකීමක් වන බැවින්, එය අචින්ත්‍ය හා අසීමිත ධර්මතාවක් ලෙස හඳුනාගත හැකිය. 'සේල සූත්‍රය' වැනි ප්‍රාථමික මූලාශ්‍රය තුළ බුද්ධ ස්වභාවය දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඔස්සේ භෞතිකව ද විස්තර කර ඇති අතර බුදුගුණ වර්ණනා කිරීමේදී 'බුදුරජාණන් වහන්සේ' වැනි ගෞරවාන්විත පද පොදුවේ භාවිත වී ඇති බව පෙනේ.

බෞද්ධ ඉගැන්වීම්වලට අනුව බුදුවරුන් පහළ වීම කාලය හෙවත් 'කල්ප' සංකල්පය හා බැඳී පවතී. කල්පයන් ශූන්‍ය කල්ප, සාර කල්ප, මණ්ඩ කල්ප, වර කල්ප, සාරමණ්ඩ කල්ප සහ භද්‍ර කල්ප වශයෙන් වර්ගීකරණය වන අතර, එක් එක් කල්පය තුළ පහළ වන බුදුවරුන් ගණන වෙනස් වේ. මෙම කාල ගණනය අතිශයින් දීර්ඝ වන අතර, බුද්ධත්වය පිණිස අවශ්‍ය පාරමිතා පූරණය ද ඊට සාපේක්ෂව අතිශය දීර්ඝකාලීන ක්‍රියාවලියකි.

ප්‍රාථමික ත්‍රිපිටක සාහිත්‍යයේ බහුලව ම සාකච්ඡාවට ලක් වන්නේ විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කස්සප සහ ගෝතම යන සත් බුදුවරුන් පිළිබඳ ව ය. ඒ ඒ බුදුරජාණන් වහන්සේලා පිළිබඳ වෙන් වෙන්ව දේශිත සූත්‍ර තුළින් උන්වහන්සේලාගේ බුද්ධත්ව අවබෝධය තහවුරු කර තිබේ. පසුව මෙම සත් බුදු සංකල්පය 'බුද්ධවංස පාළිය' වැනි ග්‍රන්ථ හරහා තවදුරටත් පුළුල් වී, තණ්හංකර, මේධංකර සහ සරණංකර යන බුදුවරුන් ද ඇතුළත්ව, දීපංකර බුදුරදුන්ගේ සිට ගෞතම බුදුරදුන් දක්වා අටවිසි (28) බුදුරජාණන් වහන්සේලා පිළිබඳ තොරතුරු ඇතුළත් සාහිත්‍යයක් බවට වර්ධනය විය. එහිදී එක් එක් බුදුරදුන්ගේ උපත, බෝධි වෘක්ෂය, අග්‍ර ශ්‍රාවකයන් සහ පරිනිර්වාණය ආදී සංක්ෂිප්ත ජීවන තොරතුරු ග්‍රන්ථගත වී තිබේ.

අටුවා සාහිත්‍යයට අනුව, බුද්ධත්වය අපේක්ෂා කරන බෝධිසත්ත්වයන් වහන්සේලා පාරමී, උපපාරමී සහ පරමාර්ථ පාරමී වශයෙන් පාරමිතාවන් සම්පූර්ණ කළ යුතු ය. එසේ ම, පාරමී පූරණය සඳහා ගතවන කාලය මත බුදුවරුන් අල්පායුෂ්ක සහ දීර්ඝායුෂ්ක වශයෙන් ද වර්ගීකරණය කර ඇත.

මෙම සාහිත්‍යමය පදනම මත පිහිටමින්, පසුකාලීනව ජනප්‍රිය භක්ති කාව්‍ය ස්වරූපයෙන් 'අටවිසි පිරිත' සහ 'අටවිසි බුද්ධ වන්දනාව' රචනා වී ඇත. අදටත් ශ්‍රී ලාංකේය බෞද්ධ ජන ජීවිතය තුළ මෙම වන්දනාක්‍රම ප්‍රබල ස්ථානයක් හිමිකරගෙන තිබේ. සෑම බුදුරජාණන් වහන්සේ නමක් වෙනුවෙන් ම වෙන් වූ ගාථා රචනා කරමින්, උන්වහන්සේලාගේ සුවිශේෂ ගුණ සිහිපත් කිරීමත්, ආශීර්වාදය හා ආරක්ෂාව අයැදීමත් මෙම වන්දනා ක්‍රමවල පොදු ලක්ෂණයකි. මීට අමතරව අටවිසි බෝධි පූජාව සහ බෝධිසත්ත්ව අවධියේ දෙමාපියන්, බිරිඳ (යශෝධරාවන් වැනි), ශ්‍රාවකයන් ආදී චරිත අරමුණු කරගත් විවිධ පූජා චාරිත්‍ර ද මේ හා සමගාමීව වර්ධනය වී ඇත.

**සාකච්ඡාව සහ නිගමනය**

මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ, බුද්ධ සංකල්පය ආරම්භයේ දී සරල සහ නිශ්චිත වූ අර්ථකථනයකට සීමා වී තිබුණ ද, කාලයාගේ ඇවෑමෙන් ත්‍රිපිටක, අටුවා සහ ජනශ්‍රැති සම්ප්‍රදායයන් ඔස්සේ එය ක්‍රමිකව වර්ධනය වී සත් බුදු සංකල්පයේ සිට අටවිසි බුදු සංකල්පය දක්වා අතිශය පුළුල් වී ඇති බවයි. මෙම වර්ධනය හුදෙක් ශාස්ත්‍රීය හෝ සාහිත්‍යමය සංසිද්ධියක් පමණක් නොවන අතර, අටවිසි බුද්ධ වන්දනාව හා අටවිසි පිරිත වැනි ජනප්‍රිය පූජා චාරිත්‍ර බිහි වීමට එය සෘජුවම බලපෑම් කර තිබේ.

බුද්ධ ස්වභාවය අචින්ත්‍ය ධර්මතාවක් ලෙස තහවුරු වීම හරහා, බුදුගුණ වර්ණනා කිරීමේදී පොදු බුද්ධරාජ පද භාවිතයට නැඹුරුවක් ඇති විය. එමගින් විවිධ බුදුවරුන් අතර යම් යම් පුද්ගලබද්ධ වෙනස්කම් පැවතිය ද, පොදු බෞද්ධ අනන්‍යතාවක් සහ පූජා චාරිත්‍ර මාර්ගයක් ගොඩනගා ගැනීමට හැකි වූ බව මෙම විමර්ශනයෙන් පෙනී යයි. ප්‍රාථමික ත්‍රිපිටක සාහිත්‍යයේ සිට බුද්ධවංස පාළිය හරහා ද්විතීයික අටුවා-ටීකා දක්වා විහිදී ගිය මෙම සංකල්පීය විකාශය, බෞද්ධ ජනශ්‍රැතිය සහ සංස්කෘතිය තවදුරටත් පොහොසත් කිරීමට ඉවහල් වී ඇත.

එපමණක් ද නොව, අටවිසි බුදුරජාණන් වහන්සේලා පිළිබඳ සංකල්පය ස්ථාපිත වීමෙන් පසුව ද බුද්ධ සංකල්පය එහි නතර නොවීය. එය බෝධිසත්ත්ව සංකල්පය ඔස්සේ අනාගත මෛත්‍රී බුදුරදුන් සහ අතීත සූවිසි (24) බුදුවරුන් වැනි සංකල්ප සමග ද බද්ධ වෙමින් ව්‍යාප්ත විය. මින් ගම්‍ය වන්නේ බුද්ධ සංකල්පය යනු චිරස්ථායී එහෙත් ගතික සංකල්පයක් බවයි. එය කිසිදා එක් නිශ්චිත රාමුවකට පමණක් කොටු නොවී, කාලානුරූපව නව අර්ථකථන සහ චාරිත්‍ර උකහා ගනිමින් නිරන්තරයෙන් වර්ධනය වන බව නිගමනය කළ හැකිය.

අනාගත පර්යේෂණ සඳහා, අටවිසි බුද්ධ වන්දනා චාරිත්‍ර කලාපීය වශයෙන් වෙනස් වන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම වැදගත් වනු ඇත. එසේම, ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන් තුළ මෙම පිළිවෙත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන අයුරු ක්ෂේත්‍ර පර්යේෂණ ඔස්සේ අධ්‍යයනය කිරීමත්, ආසියානු කලාපයේ මහායාන සහ වජ්‍රයාන වැනි වෙනත් බෞද්ධ සම්ප්‍රදායන් තුළ බුද්ධ සංකල්පය පරිණාමය වූ ආකාරය සමග මෙය සංසන්දනය කිරීමත් අනාගත පර්යේෂකයන්ට මහඟු පිටිවහලක් වනු ඇත.

**ප්‍රමුඛ පද :** අටවිසි බුදුරජාණන් වහන්සේලා, බුද්ධ වන්දනාව, බුද්ධ වාචයාර්ථය, බුද්ධ සංකල්පය, සංකල්පීය සංවර්ධනය

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තරනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඛුද්දකනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*චුල්ලවග්ගපාළි*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*පන්සිය පනස් ජාතක පොත් වහන්සේ*, (2008). කොළඹ: ඇම්, ඩී ගුණසේන සහ සමාගම.

*පරිවාරපාළි*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*පාචිත්තියපාළි*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවග්ගපාළි*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මිලින්දපඤ්හය*, (1997). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුක්තනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

චන්ද්විමල හිමි, ආර්. (2006). *පාරමිතාප්‍රකරණය* (11 වන මුද්‍රණය). පොකුණුවිට: ශ්‍රී චන්ද්විමල ධර්ම පුස්තක සංරක්ෂ මණ්ඩලය.

චන්ද්විමල හිමි, ආර්. (2012). *සුවිසි මහාගුණය* (14 වන මුද්‍රණය). පොකුණුවිට: ශ්‍රී චන්ද්විමල ධර්ම පුස්තක සංරක්ෂ මණ්ඩලය.

ධම්මතිලක හිමි, පී. (2008). *බෝධිසත්ත්ව සංකල්පය*. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

විපස්සි හිමි, රඹුක්වැල්ලේ. (1997). සංස්, *අභිධානප්පදීපිකා නම් වූ පාලි නිඝණ්ඩුව*. කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ.

ශ්‍රී පියරතන නාහිමි, එම්. (2013). සංස්, *පිරුවානා පොත්වහන්සේ නම් මහ පිරිත් පොත*. කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.